සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

57351

Learning Resource Center

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

22-11-2016

| ශ්‍රේණිය / தரம் / Grade | 9 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:

- පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. I, II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

I කොටස

- ඉරි ඇඳි පදයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.

(01) සේනාරත්න මුල් ගුරුතුමා පාසල් වහලයේ උළු කැට මාරු කරන අයුරු බලා සිටි ගුණවතී ඉස්කෝලෙ හාමිනේ ඔහුට සරදම් කළා ය.
(1) බැණ වැදුණා ය. (2) විහිළු කළා ය. (3) අපහාස කළා ය. (4) ස්තුති කළා ය.

(02) තාත්තා තනිව ම කුඹුරු කොටද්දී සිරිමල් සෝමාරියෙකු ලෙස බලා සිටින බව අම්මා කීවා ය.
(1) මෝඩයෙකු (2) අදක්ෂයෙකු (3) කපටියෙකු (4) අලසයෙකු

- මහාප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වචනය තෝරන්න.

(03) ව්‍යවහාර / ඥානය / ප්‍රශස්ත / ප්‍රබුද්ධ

- සඤ්ඤක අක්ෂරයක් යෙදී නැති වචනය තෝරන්න.

(04) නිට්ටඹුව / හඳපාන්ගොඩ / කළුතර / පඬුවස්නුවර

- දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරන්න.

(05) පොදු - (සාමාන්‍ය / පෞද්ගලික / විශේෂ)

- සමාන පදය වරහන් තුළින් තෝරන්න.

(06) අභිවෘද්ධිය - (වෘද්ධිය / දියුණුව / පරිහානිය)

(07) අභිමතාර්ථය - (කැමැත්ත / අභිලාෂය / බලාපොරොත්තුව)

- පද දෙකක් එකතු වී සෑදී ඇති පද නිවැරදි ව වෙන්කර ලියා ඇති පිළිතුරු තෝරන්න.

(08) ගමනාගමන i. ගමන + ආගමනය ii. ගමන + ගමන
iii. ගමන් + ආගමන iv. ගම + නාගමන

(09) වාරාවසාන i. වර + වසාන ii. වාරාව + සාන
iii. වාර + අවසාන iv. වාරය + අවසාන

- අනුක්ත පදය තෝරන්න.

(10) මිනිසෙක් / ගායකයෝ / දක්‍ෂයෙකු / මුවැත්තියක්

(11) නැගණියක් / දරුවෙක් / කාන්තාවෝ / කුහුඹුවන්

- තද්ධිත නොවන පදය තෝරන්න.

(12) ශෛලමය / කරුණාවන්ත / පිතිමුවා /රූමත්

- කෘදන්ත පදයක් වන පදය තෝරන්න.

(13) ලියවයි / ලියුම් / ලියලියා / ලියමින්

- නිවැරදි පදය වරහන් තුළින් තෝරන්න.

(14) හිරු..............................වැදී පිනිබිඳු වියළී යයි (කිරන / කිරණ)

(15) වෙද මහතා.............................. තුළට පිවිසියේ ඖෂධ සෙවීමට ය. (වණය / වනය)

- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

(16) විශ්වය / නිශ්පාදන / නිශ්ඵල / ආශ්වාද

- ඉරි ඇඳි ක්‍රියාපද වර්ගය තෝරන්න.

(17) වන අලියා හේන පාළු <u>කරද්දී</u> ගොවියා මහහඬින් කෑ ගැසුවේ ය.
(1) අසම්භාව්‍ය ක්‍රියා (2) පූර්ව ක්‍රියා (3) විධි ක්‍රියා (4) මිශ්‍ර ක්‍රියා

(18) උපාසිකාව බෝමළුවේ <u>ඇවිදිමින්</u> සක්මන් භාවනා කළා ය.
(1) පූර්ව ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා (3) අසම්භාව්‍ය ක්‍රියා (4) විධි ක්‍රියා

- සුදුසු ක්‍රියාපදය තෝරන්න.

(19) සිටාණෝ රජවාසලට ගොස් රජතුමා.......................... (හමුවිය / හමුවූයේය/ හමුවෙයි / හමුවූහ)

- පහත දැක්වෙන පද්‍යයේ හිස්තැන් සඳහා සුදුසු පද පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

(20) ඉඳුනිල් ...................... එපැහැයු රායා
විලිකුන් ...................... තුඩුගිනි රායා
(1) කොළ ඉරා / අඹ උරා (2) උර උරා / කොළ දරා
(3) කොළතුරා / අඹ උරා (4) කොළ දරා / උර උරා

(ලකුණු 2 × 20 =40)

## II කොටස

- 1, 2 ප්‍රශ්න අනිවාර්යය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(01) පන්ති කාමරයේ දී ඇගයීම් ප්‍රභේදයක් ලෙස කරන ලද චරිතාරෝපිත කතා ඇසුරින් පහත දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(අ) චරිතාරෝපිත කතාවක් කිරීම සඳහා ඔබගේ පෙළ පොත ඇසුරෙන් තෝරාගෙන තිබූ චරිත දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) ඔබ විසින් කරන ලද චරිතාරෝපිත කතාව සඳහා ලකුණු ලබාදුන් නිර්ණායක දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඉ) ඔබගේ කතාව ඉදිරිපත් කරන විට පන්තියේ සෙසු පිරිස දක්වූ ප්‍රතිචාර දෙකක් ලියන්න. (ලකුණු 04)

(ඊ) එම තෝරාගත් චරිතාරෝපිත කතාවෙන් ඔබට ලැබුණු ආදර්ශ දෙකක් ලියන්න. (ලකුණු 04)

(උ) ඇගයීම අවසානයේ දී ගුරුතුමිය ලබා දුන් ප්‍රතිපෝෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(02) පහත සඳහන් විස්තර අතුරෙන් එකක් තෝරාගෙන ඊට අදාළ මාතෘකාව යටතේ වචන 200කට නො අඩු රචනාවක් ලියන්න.

(අ) මත් උවදුර අප රටේ දරුණු ව්‍යසනයක් බවට පත් වී තිබේ. දිනෙන් දින වැඩිවන අපරාධවලට මූලික හේතුව වන්නේ ද මත් උවදුර බව නොරහසකි. වර්තමාන තරුණ පරපුර මත් රකුසාගෙන් බේරාගත යුතු කාලය එළඹ ඇත. ''මත් උවදුර පිටු දකිමු'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ආ) වන්දනීය වූ අපගේ මාතෘභූමිය පිළිබඳ ව අපට ඇත්තේ මහත් අභිමානයකි. දේශ වාත්සල්‍යය හා දේශාභිමානය පෙරදැරි ව උත්තරීතර හැඟීමෙන් යුතු ව අපේ මුතුන්මිත්තෝ ක්‍රියාකළ බව ඓතිහාසික ශ්‍රී විභූතිය දකිමෙන් අපට පැහැදිලිවේ. 'ශ්‍රී ලංකාව හා දේශාභිමානි හැඟීම්'
මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) කෘෂිකර්මාන්තය හා බැඳී පැවති ගොවි සිරිත් විරිත් පුද පූජා, ඇදහිලි සහ විශ්වාස අද සමාජයෙන් ඈත් වෙමින් පවතී. ගමයි පන්සලයි , වැවයි දාගැබයි එදා හෙළ ගැමි ජීවිතය වර්ණවත් කළේ ය. 'බුදු දහමින් ප්‍රභාවිත වූ අපේ කෘෂි සංස්කෘතිය' පිළිබඳ ව රචනයක් ලියන්න.

(ඊ) විවේකය විනෝදයෙන් ගත කිරීම සඳහා විවිධ පිරිස් විවිධ ක්‍රම උපයෝගී කරගනිති. එහෙත් ඒවායේ ඇති වැදගත්කම පිළිබඳ ව ඔවුහු කල්පනා නොකිරීම ගැටලුවකි. කියවීම නිසා පිරිපුන් ජීවිතයකට අවශ්‍ය දැනුම ලබාදෙන අතර ම අමතර දැනුමක් ද ලබාගත හැකි ය. ''කියවීම පිරිපුන් මිනිසෙකු බිහිකරයි'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ලකුණු 14)

(03) පිහිනුම් තරගාවලියෙන් ශ්‍රී ලංකාව නියෝජනය කර ජගත් කීර්තියට පත්ව රන් පදක්කමක් ලබා මවුබිමට පැමිණෙන ක්‍රීඩකයෙකුගේ ජයග්‍රහණය සඳහා යවන සුබ පැතුමක් ලියන්න.

නැතහොත්

ඔබ පාසලේ 9 ශ්‍රේණියේ සිසුන් විසින් රුක්රෝපණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජිත ය. එම ව්‍යාපෘතිය මගින් පලතුරු පැළ 20ක් පාසල් වත්තේ සිටුවීම සඳහා අපේක්ෂිත බැවින් ඊට ආධාර හා උපදෙස් ලබාදෙන මෙන් ඉල්ලා ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාපෘති නිලධාරිතුමාට ලිපියක් ලියන්න. ඔබ විද්‍යාලයීය රුක් රෝපණ සංගමයේ ලේකම් පාලිත සහබන්ධු යැයි අනුමාන කරන්න. (ලකුණු 10)

(04) පහත පද්‍යවල ඉතිරි පාද දෙක සම්පූර්ණ කරන්න.

(අ) මන්මත් කරවන දන මුළු දෙරණා
රසවත් වන වෙණ නද නද කරණා
..............................................................................
..............................................................................

(ආ) ..............................................................................
..............................................................................
පුංචි කටින් කුරු වී ගෙඩි තලන්නේ
මෙදා යලේ ණය නොකරවි කුරුල්ලනේ

(ලකුණු 5 × 2 = 10)

(05) අවස්ථා සම්බන්ධය ලියන්න.

(අ) 'මේ සියලු සත් කාර්යන්ගේ ජීවය එතුමා ය'
(ආ) 'දත් ඉතින් ගිය හකුරට අඬලා වැඩක් නැහැ'
(ඉ) 'ඔබට එක් වචනයක් කියනු කැමැත්තෙමි'
(ඊ) 'මවකට තම දරුවා තරම් වටිනා ආරක්ෂා කළ යුතු තවත් මහඟු සම්පතක් නැහැ'
(උ) 'මෝහට මසුරන් දහසක් දෙව'

(ලකුණු 2 × 5 = 10)

(06) පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බොල් පිනි බරින් පවනින් ගිලිහෙන රොන් ය
නිල් තණ බිමින් නැගි පැහැයත් රත්වත්ය
මල් මී ලොබින් බැඳ එන බිඟු කැන්ය
කුල්මත් ඔවුන් තුඩ'තෙත ගුමු ගුමු සන්ය

පෙළා ගස් නමා අතු අග නගා හොඬ
සලා බුදින ගජසෙන් යති කඩින් කඩ
තලා කැකුණ වෙහෙසෙන වල් ඌරු ගොඩ
වලා හබන් කුකුළෝ නැඟු මඟුල් හඬ

(අ) මල් මී යනු මොනවා ද?
(ආ) මල් මී නිසා කුල්මත් ව නද දෙන්නේ කවුරුන් ද?
(ඉ) වල් ඌරන් කරන්නේ කුමක් ද?
(ඊ) ඒවා දැක සතුටුවන්නේ කවරහු ද?
(උ) අර්ථය ලියන්න.
(i) බිඟුකැන් (ii) ගජසෙන්

(ලකුණු 2 × 5 = 10)

(07) පහත දී ඇති වාක්‍ය නිදොස් කොට ලියන්න.

(අ) මා දක්ෂ ගායිකාවක වෙමි.
(ආ) ජනාධිපතිතුමා පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව ඇමතුහ.
(ඉ) ඉංග්‍රීසින් විසින් දේශීය වෛද්‍ය ක්‍රමය විනාශවන අයුරින් වැඩ කළේ ය.
(ඊ) ගස්වැල් තම වර්ගයා බෝ කිරීමට ප්‍රයත්න දරති.
(උ) නුඹලා විදේශීය සංචාරයට සහභාගි වන්නේ ද?

(ලකුණු 2 × 5 = 10)